**වාරියපොළ ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට, ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වාරියපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව**

සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වාරියපොල නව වෙළඳ සංකීර්ණයට විදුලිය ලබා ගැනීම සඳහා දරන ලද රු.14,864,533 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2024 අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය රු.3,500,000 අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදි ගිණුම් තැබීම කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සභාව සතු බැංකෝ ලෝඩරයේ වටිනාකම රු.6,120,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට පියවා තිබූ රු.362,000 ක් වටිනාකම වූ කර්මාන්ත තැන්පත් 06 ක් මූල්‍ය ප්‍රකාශනවල නිරවුල් නොකළ තැන්පත් ලෙස දක්වා තිබුණි. | -එම- | තැන්පතු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සභාව සතු පාදෙනිය ගිමන්හල වටිනාකම රු.489,617 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | තහවුරු කරගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | 134 වගන්තිය | සභාව විසින් සේවා සපයන සංවර්ධිත ගම් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 570 හා 571 | වටිනාකම රු.1,923,120 ක් වූ තැන්පත් 36 ක් රෙගුලාසි ප්‍රකාරව නියාදනය කර නොතිබුණි. | නිරීක්ෂණ සමඟ එකගවන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ | | | |
| | 3 වගන්තිය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා කාර්යය මණ්ඩලය සතු විය යුතු නිපුණතා පැහැදිලිව හඳුනාගත යුතු බවත් ඒ සඳහා ක්‍රමවේදයක් පැවතිය යුතු බවත් දක්වා තිබුණ ද අදාළ පරිදි කටයුතු කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පළාත් පාලන චක්‍රලේඛ | | | |
| (i) | 2010 ජූලි 30 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තු අංක 2010/02 චක්‍රලේඛයේ 1.2. වගන්තිය | රාජකාරි කිරීමේ දී විෂය මාරු ක්‍රමයක් හා එසේ සිදු කිරීම අපහසු නිලධාරින් සඳහා වසර 02 කට වරක් කොට්ඨාස මාරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | අංක 03/2015 හා 2015/11/02 දිනැති චක්‍රලේඛය | වීදි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය | | | |
| | 10 වගන්තිය | 2023 වර්ෂයට ආයතන 10 ක් බලපත්‍ර ලබා නොගැනීම නිසා අයවිය යුතුව තිබූ පරිසර බලපත්‍ර ගාස්තු ආදායම් අහිමි වී තිබුණි. | නිරීක්ෂණ සමඟ එකඟ වන බව | නීතී රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| (i ) | 61 රීතිය | වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබා ගන්නා ලැයිස්තුවේ ඇතුළත් සියලුම කර්මාන්ත, කර්මාන්ත බදු පිළිබඳ ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත්, ගාස්තු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. බදු නොගෙවන කර්මාන්ත පිළිබඳව ලේඛනවල ඇතුළත් නොවූ අතර ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමර්ග ගෙන නොතිබුණි. | -එම- | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii ) | 218 රීතිය | පත් කළ මණ්ඩලයක් විසින් වාර්ෂිකව ඉඩම් ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | 4.2.1 (ආ) මාර්ගෝපදේශය | අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු කර නොතිබුණි. | පිළිගන්නා බව | මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන ආදායම ඉක්ම වූ වියදම රු.13,135,390 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.14,431,413 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල්කල ආදායමෙන් | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (බිල් කල ආදායමෙන් |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 10,424 | 9,128 | 6,874 | 2,254 | 10,330 | 9,063 | 6,162 | 2,901 |
| කුලී | 31,462 | 13,345 | 13,204 | 140 | 16,375 | 9,738 | 9,737 | 469 |
| බලපත්‍ර ගාස්තු | 2,205 | 2,348 | 2,348 | - | 1,676 | 2,091 | 2,090 | - |
| වෙනත් ආදායම් | 134,540 | 50,656 | 131,158 | (80,502) | 143,665 | 872,147 | 16,275 | 973 |
| එකතුව | 178,631 | 75,477 | 153,584 | (78,108) | 172,046 | 893,039 | 34,264 | 4,343 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් වටිනාකම වූ රු.4,609,534 න් සියයට 51 ක් පසුගිය වසරවල හිඟ විය. සභාවට වරිපනම් අයකරන මුළු ඒකක ගණන වූ 4698 න් ඒකක 1885 කින් හිඟ වරිපනම් අයවිය යුතු ව පැවතුණි. | පිළිගන්නා බව | හිඟ ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් වැඩ පිළිවලක් සකස් කර හිඟ ශේෂ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,507,720 ක් වූ අතර සමාලෝචිත වර්ෂයට අදාළව රු.28,500,000 ක් හා 2022 වර්ෂයට අදාළ රු.19,042,443ක් ලෙස එකතුව රු.47,542,443ක් වූ මුද්දර ගාස්තු වටිනාකමක් ද අයවිය යුතු ව පැවතුණි. | පිළිගන්නා බව | හිඟ ශේෂ ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යන් ඉටුකිරීම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය රු.57,610 ක් හා පුනරාවර්තන වැය රු.25,015,604 ක් දරා තිබුණ ද කසළ අලෙවියෙන් ලද ආදායම රු.534,044 ක් පමණක් විය. | පිළිගන්නා බව | දිරන හා නොදිරන කසල නිසි පරිදි කළමනාකරණය කිරීමටත් ආදායම් උත්පාදනය කටයුතු වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක වටිනාකම රු.91,161,023 ක් වූ විය. | නිරීක්ෂණය සමඟ එකඟ වන බව | සභාව වෙත අයවිය යුතු ශේෂ කඩිනමින් අය කර ගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු ජීව වායු ඒකකය 2021 වර්ෂයෙන් පසු අක්‍රීය තත්ත්වයේ පවතින අතර එම ඒකකය අළුත්වැඩියා කර ඵලදායී ලෙස භාවිත කිරීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | -එම- | සම්පත් උපරිම පරිදි භාවිත කළ යුතු ය. |
| (ඉ) | ගලි රථය මගින් රැස්කරන අපද්‍රව්‍ය බැහැර කිරීම සභාව වෙත හිමිකමක් නොමැති පෞද්ගලික ඉඩමකට සිදු කරයි. එම ඉඩම හිමිකරු විසින් සභාව වෙත මළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ඒකකයක් ස්ථාපිත කරවීම සඳහා ඉඩම ලබා දීමට 2016/09/28 දින දිව්රුම් ප්‍රකාශයකින් එකඟතාව පලකිරීම මත අදාළ ඉඩමට අපද්‍රව්‍ය බැහැර කිරීම සිදුකරන බව නිරීක්ෂණය වුව ද මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ දී ඒවා පසට හා භූගත ජලයට එකතු වීම වැළැක්වීම සඳහා ප්‍රතිකර්ම (Treatment) සිදු කරන බවක් හෝ මළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ඒකකයක් විධිමත්ව පවත්වා ගෙන යන බවක් තහවුරු නොවීය. | -එම- | අපද්‍රව්‍ය බැහැර කිරීම පරිසර හිතකාමී ලෙස විය යුතු ය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් , ගොඩනැගිලි හා වාහන සඳහා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | පිළිගන්නා බව | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු ය. |
| (ආ) | සභාව විසින් නඩත්තු කරන සියලු විදුලි පහන් කනු අංකනය කර එම තොරතුරු ඇතුළත් ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වුවත් එසේ යාවත්කාලීනව පවත්වා ගන්නා ලේඛනයක් නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | වටිනාකම රු.2,635,000 ක් වූ ඉඩම් 05 ක මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | -එම- | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විධිමත් පරිදි සමීක්ෂණයක් සිදුකර සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි හා සුසාන භූමි හඳුනා ගැනීමටත් ,ඒවායේ භෞතික පැවැත්ම තහවුරු වන පරිදි වැට මායිම් යෙදීමටත් නිසි පරිදි කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව | සියලුම ඉඩම් වත්කම්වල භෞතික පැවැත්ම ආරක්ෂා කළ යුතු ය. |
| (ඉ) | නළ ළිං හා පොදු ළිංවල පිහිටීම , භාරකාරිත්වය හා ඒවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විධිමත් සමීක්ෂණයක් කාලීනව සිදුකර යාවත්කාලීන තොරතුරු ඇතුළත් ලේඛනයක් සභාව විසින් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සභාව සතුව පවරා නොගත් ඉඩම් ගොඩනැගිලි වත්කම් 114 ක් පැවතුණි | පිළිගන්නා බව | සියලුම ඉඩම් වත්කම්වල භෞතික පැවැත්ම ආරක්ෂා කළ යුතු ය. |
| (උ) | සභා බල ප්‍රදේශයේ පිහිටි පොදු ළිං සංඛ්‍යාව 329ක් වූ නමුත් සභාවට හිමිකාරිත්වය පවරා තිබූ පොදු ළිං සංඛ්‍යාව 85ක් පමණක් විය. | -එම- | -එම- |
| (ඌ) | හිමිකාරිත්වය පවරා නොගත් ඉඩමක සභාවෙන් වැය දරා ඉදිකර තිබූ පාදෙනිය ගිමන්හල ගොඩනැගිල්ල වෙනුවෙන් සභාව විසින් ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.431,750 ක් බදු කුලී සහ රු.127,000 ක වෙනත් වැය දරා තිබුණි. | පිළිගන්නා බව | සියලුම ඉඩම් වත්කම්වල භෞතික පැවැත්ම ආරක්ෂා කළ යුතු ය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා අතිරික්තව සිටි ප්‍රමාණය 54 ක් විය. | පිළිගන්නා බව | කාර්යය මණ්ඩල අවශ්‍යතාවය කාලීනව සමාලෝචනය කර ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනුමත කාර්යමණ්ඩලය ඉක්මවා අනියම්,ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික වැටුප් පදනම යටතේ බඳවා ගත් සේවකයින් 16 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.712,800 ක් ගෙවීම් කර තිබුණි. | -එම- | -එම- |

### 3.6 නිෂ්කායර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාදෙනිය ගිමන්හල කඩකාමර 08 ක්, කටුපොත බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩකාමර 15 ක් හා වාරියපොල නව පොදු වෙළඳ සංකීර්ණය නිෂ්ක්‍රීයව පැවතුණි. | පිළිගන්නා බව | නිෂ්ක්‍රීය වත්කම් ක්‍රියාකාරී තත්ත්වයට පත් කළ යුතු ය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 කියාකාරි සැලැස්ම

| | | |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂයට ඉටුකළ යුතු කර්තව්‍යයන් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද, එහි දී හඳුනාගත් විශේෂිත දර්ශක 81 ක් සම්බන්ධව වර්ෂය තුළ කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | පිළිගන්නා බව | සැලසුම් සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර එහි රාජකාරි සඳහා නිලධාරියෙකු පත්කර තිබුණ ද එම නිලධාරියා වෙත අභ්‍යන්තර විගණනයට අමතරව වෙනත් රාජකාරි ද පවරා තිබීම හේතුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | පිළිගන්නා බව | සභාවේ කටයුතු පිළිබඳ උචිත හා ප්‍රමාණවත් විගණනයක් සිදු කළ යුතු ය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආදායම් විෂයයන් 04 ක ඇස්තමේන්තුගත හා සත්‍ය ආදායම් අතර සියයට 25 ක සිට 77 ක් දක්වා විචලනයක් පැවති අතර වියදම් විෂයයන් 05ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 30 කට වඩා වැඩි විචලනයක් පැවතුණි. | පිළිගන්නා බව | ආදායම් වියදම් තාර්කිකව කළමනාකරණය කරගත යුතු ය. |